# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1958/17 - 2016 මාර්තු මස 16 වැනි බදාදා - 2016.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 12/2015

**2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත**

2 වන වගන්තිය යටතේ නියමය

2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් -

(අ) මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රටවල් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු රටවල් වශයෙන් ද ; සහ

(ආ) එම රටවල් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු දිනය, 2015 සැප්තැම්බර් මස 05 වන දිනය වශයෙන් ද,

නිශ්චිතව දක්වමි.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2016 මාර්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

*නිශ්චිත රටවල්*

1. රුසියානු සමූහාණ්ඩුව
2. දකුණු කොරියාව

04 - 207


1A - PG 2887 — 106 (2016/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*